**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2021**

-----------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරනය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සියා බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ
---------------------------------------------------------------------------

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
-----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ---------------------- | ------------ |
| නවදිගන්තය මධ්‍යස්ථානය වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ගොඩනැගිලි ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ නිසි ලෙස ලේඛනගත කර නොතිබීම, පැන්සලෙන් සටහන් කර තිබීම, දින යොදා නොතිබීම හා අනුක්‍රමික අංක පිළිවෙලට සටහන් නොකිරීම වැනි අඩුපාඩුද, නවදිගන්තය සහ මහනුවර මධ්‍යස්ථානයන්හි මුදල් පොත නිසි ලෙස හා සම්පූර්ණණ ලෙස පවත්වා නොතිබීම හා වාහනවල දෛනික ධාවන සටහන් සම්පූර්ණ කර නොතිබීම වැනි අඩුපාඩුද පැවති අතර මණ්ඩලය විසින් මධ්‍යස්ථානවල කටයුතු නිසි ලෙස අධීක්ෂණය කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. | මෙම අඩුපාඩු නිවැරදි කරන බව හා යළි ඇති නොවීමට කටයුතු කරන බව. | මධ්‍යස්ථාන සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේද හඳුන්වාදී ක්‍රියාත්මක කළ යුතුය. |

1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් සියලු වත්කම් මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.73,583,056 ක්වූ ඉඩම් හා ගොඩනැගිලිවලින් මුළු පිරිවැය රු.10,447,264 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. ඒ හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුළු පිරිවැය රු.63,135,792 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එහි පිරිවැයටත් මුළු පිරිවැය රු.10,447,264 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එහි ප්‍රත්‍යාගණන අගයටත් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. | මහනුවර හා නවදිගන්තය මධ්‍යස්ථාන වල ප්‍රත්‍යාගණන කටයුතු නිම කර ඇති බව, ගාල්ල හා තලංගම ප්‍රතිකාර මධ්‍යස්ථාන 02 හි ප්‍රත්‍යාගණන කටයුතු මේ වන විට අවසන් අදියරයේ පවතින බව හා සියළු වත්කම්වල ප්‍රත්‍යාගණන වටිනාකම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.195,730,952 ක් වූ වත්කම් වල ඵලදායී ජීවකාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ජංගම නොවන වත්කම්වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීව කාලය ඇස්තමේන්තු කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති බව හා ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 59 ඡේදය ප්‍රකාරව, විශ්‍රාම ප්‍රතිලාභ වගකීම වට්ටම් ක්‍රමය මත අගය කර නොතිබුණු අතර එම වගකීම රු.58,433,472 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව. | -එම- |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.928,085 ක් වූ අස්පෘශ්‍ය වත්කම් වෙනම අයිතමයක් ලෙස හෙළිදරව් කර නොතිබුණු අතර ඒ වෙනුවට දේපළ පිරියත හා උපකරණවල පිරිවැයට එකතු කර දක්වා තිබුණි. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 117 ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතු තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | -එම- | -එම- |

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | | |
| (අ) දේපළ, පිරියත හා උපකරණ | 781.47 | 776.24 | 5.23 | වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකරමින් ඉදිරි වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකරමින් ඉදිරි වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) සමුච්චිත ක්ෂය වෙන්කිරීම | 280.36 | 286.90 | 6.54 | -එම- | -එම- |

1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල | අවිනිශ්චිත ලෙස තිබුණු කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | වර්ෂ | | |
| අවිනිශ්චිත ගිණුම | 480,900 | 08 | සියළුම මූලාශ්‍ර ලේඛන පරීක්ෂා කරමින් අවිනිශ්චිත ගිණුමේ ශේෂයට හේතු හඳුනාගැනීමට කටයුතු කරමින් පවතින බව. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හැකි ඉක්මනින් හඳුනා ගෙන නිරවුල් කළ යුතුය. |

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

1.6.1 අත්තිකාරම්
--------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ පැවති හර ශේෂය රු.1,782,060 ක් වර්ෂ 20 කට වැඩි කාලයක සිට චලනය නොවී පැවති අතර එම ශේෂයෙහි නිරවද්‍යතාව සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | මෙම ශේෂ හඳුනාගැනීමට මණ්ඩලයේ මූල්‍ය අංශය විසින් කටයුතු කරමින් සිටින බව. | අත්තිකාරම් ගිණුම් ශේෂයෙහි නිරවද්‍යතාව සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම
------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 4 වන වගන්තිය | ප්‍රතිකාර මධ්‍යස්ථානවල කටයුතු පිළිබඳව සහ ඖෂධවලට ඇබ්බැහිවූවන්ට ප්‍රතිකාර ලබාදීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීමෙහිලා මධ්‍යස්ථානවල සාර්ථකත්වය පිළිබඳව තොරතුරු ඇතුළත් කර නියමිත කාලන්තරීය වාර්තා ප්‍රතිකාර මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරයා විසින් 2019 සැප්තැම්බර් 19 දින සිට මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මධ්‍යස්ථානවල ප්‍රගතිය සම්බන්ධයෙන් වාර්තා ඉදිරියේදී මණ්ඩලය වෙත සපයා ගැනීමට කටයුතු කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 138 | සෑම ගෙවීම් වවුචරයක්ම බලයලත් නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වුවද, රු.3,260,941 ක ගෙවීම් වවුචර් 24 ක් සහතික කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයකදී තහවුරු විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදුන් බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 156 (5) | මුදල් පොතෙහි සහ මුදල් සම්බන්ධ ලියකියවිලිවල වෙනස්කම් සිදුකර තිබුණු නමුත් මුදල් රෙගුලාසිය ප්‍රකාරව එම පොත් හා ලියකියවිලිවල මුලින් අත්සන් කර ඇති හෝ ඒ සඳහා බලය ඇති වෙනත් නිලධාරියෙකු විසින් හෝ තම සම්පූර්ණ අත්සන යොදා සහතික කර නොතිබුණු අවස්ථා 08 ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණයකදී නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (iii) මුදල් රෙගුලාසි 225 | නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් ගෙවීම් වවුචර පිළියෙළ කර නොතිබුණු අවස්ථා 32 ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණයකදී නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (iv) මුදල් රෙගුලාසි 395 | මණ්ඩලය සතු ජංගම ගිණුම් 04 ට අදාළව පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශන ගෙවන නිලධාරියා විසින් සහතික කර නොතිබුණි. | -එම- | -එම- |
| (v) මුදල් රෙගුලාසි 446 (2) | සියලුම සටහන් සහ මුදල් ශේෂය නිවැරදි බවට සහතිකයක් ලෙස වගකිව යුතු අධීක්ෂක හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් මුදල් පොත අත්සන් කර නොතිබුණි. | -එම- | -එම- |
| (vi) මුදල් රෙගුලාසි 754 | මණ්ඩලයෙහි නවදිගන්තය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානයෙහි ඉන්වෙන්ට්‍රි ලේඛන තුලනය කර වසර අවසානයේ ශේෂය ඉදිරියට ගෙන නොතිබුණි. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2018 | මාසික වැටුප පදනම් කර ගැනීමෙන් තොරව එක් සේවකයෙකුට අවස්ථා දෙකකදී සංයුක්ත දීමනාව වැඩිපුර ගෙවා තිබුණු බව නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය. | වැඩිපුර ගෙවා ඇති මුදල අදාළ සේවකයාගෙන් අය කර ගැනීමට කටයුතු කරන බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාණ්ඩලීය ප්‍රතිකා අංක 64/2019 | අනුමත අතිකාල පැය ගණනට වඩා වැඩිපුර පැය ගණන් වෙනුවෙන් රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයන් 03 දෙනෙකු වෙත අතිකාල දීමනා ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල අදාළ සේවකයින්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන බව. | මාණ්ඩලීය තීරණ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,018,049 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,697,278 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,715,327 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට නවදිගන්තය මධ්‍යස්ථානය සඳහා ලද ආධාර රු.31,054,982 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය භාවිතය පිටු දැකීමේ රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ඒකාබද්ධ සම්මේලනය (SLFONGOADA) නමින් වූ රාජ්‍ය නොවන සංවිධානය ස්ථාපිත ගොඩනැගිල්ලේ කුලිය වශයෙන් රු.330,000 ක් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය භාවිතය පිටු දැකීමේ රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ඒකාබද්ධ සම්මේලනය (FONGODA) 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනත යටතේ අනු කමිටුවක් ලෙස 1986 දී පිහිටුවා ඇති බව හා මාණ්ඩලීය අනුමැතිය ඇතිව ගෙවා ඇති බව. | මණ්ඩලයේ වියදම් දැරීම සඳහා පමණක් භාණ්ඩාගාර ප්‍රදාන උපයෝගී කර ගත යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාල සිසුන් ඇතුළු විද්වතුන්ගේ පරිශීලනය සඳහා පැවති මණ්ඩලයෙහි ප්‍රධාන කාර්යාලය තුළ පවත්වාගෙන ගිය මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ පොත්පත් 2,689 කින් සහ වැදගත් ලිපිලේඛන හා සඟරා වලින් සමන්විත වූ පුස්තකාලය, ප්‍රධාන කාර්යාල භූමියෙන් තලංගම මධ්‍යස්ථානය වෙත 2021 අගෝස්තු මාසයේදී මාරුකර යවා තිබුණි. 2022 අගෝස්තු මාසය වන විට වසරක් ගතවී තිබුණු නමුත් පිරිවැය රු.1,484,156 ක් වටිනා පොත්පත් භාවිතයකින් තොරව තලංගම මධ්‍යස්ථානයෙහි ගොඩ ගසා තිබුණි. පුස්තකාලයට අනුයුක්තව සිටි පුස්තකාලාධිපති සහ පුස්තකාල සහායක නිලධාරීන් ප්‍රසම්පාදන අංශයේ රාජකාරිවලට අනුයුක්ත කර තිබුණි. | මේ වන විට පුස්තකාලය යළි ස්ථාපනය කිරීමට කටයුතු කරමින් පවතින බව. | පුස්තකාලය හැකි ඉක්මනින් නිසියාකාරව ස්ථාපිත කර පරිශීලකයින් සඳහා විවෘත කළ යුතුය. |
| (ආ) | මහනුවර, නවදිගන්තය හා ගාල්ල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා රු.612,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු CCTV කැමරා පද්ධති ක්‍රියාත්මක නොවන නමුත් ඒවා අලුත්වැඩියා කිරීමට හෝ නව උපකරණ සවි කිරීමට හෝ කටයුතු කර නොතිබීම එම මධ්‍යස්ථානවල ආරක්ෂාවට දැඩි බලපෑමක් එල්ලවී තිබුණි. 2019 ඔක්තෝබර් මාසයේදී නවදිගන්තය මධ්‍යස්ථානය තුළ සේවාලාභියකු සියදිවි නසාගෙන තිබුණු නමුත් CCTV කැමරා නොමැතිකමින් ඒ පිළිබඳ සාක්ෂි ලබා ගැනීමට නොහැකිවී තිබුණි. | CCTV කැමරා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022 වසරේදී ආරම්භ කර ඇති නමුත් පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් භාණ්ඩාගාරයෙන් ඒ සඳහා ප්‍රතිපාදන ලැබෙන තෙක් ප්‍රසම්පාදන කටයුතු නවතා ඇති බව. | අත්‍යාවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනයන් කඩිනම් කිරීමට හැකි උපරිමයෙන් කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලැබී තිබුණු භාණ්ඩාගාර අග්‍රිම මුදල රු.මිලියන 16.473 කින් රු. මිලියන 7.731 ක් හෙවත් සියයට 47 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආයතනය වසා තැබීම, සේවාමුර ක්‍රමයට සේවයට වාර්තා කිරීම හා වියදම් අවම කිරීමට සිදුවීම ප්‍රාග්ධන වියදම් පිළිබඳ ක්‍රියාවලිය ප්‍රමාදවීමට හේතුවූ බව. | CCTV කැමරා වැනි අත්‍යාවශ්‍ය ප්‍රාග්ධන වියදම් සඳහා මණ්ඩලය වෙත ලැබෙන අග්‍රිම මුදල් උපරිම ලෙස උපයෝජනය කළ යුතුය. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංශෝධිත විෂ, අබිං සහ අන්තරායදායක ඖෂධ ආඥාපනතෙහි සඳහන් මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම කිරීම සඳහා හෙරොයින්, කොකේන් සහ මොෆීන් ප්‍රමාණය ග්‍රෑම් 02 සිට ග්‍රෑම් 05 දක්වා ඉහළ නැංවීමට ඉදිරිපත්වී තිබුණු යෝජනා සම්බන්ධයෙන් මණ්ඩලයෙන් කරුණු දැක්වීමක් සිදු කර නොතිබුණි. | අමාත්‍යාංශය මගින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් නිසා මණ්ඩලයේ නිර්දේශ යැවීම නුසුදුසු බව. | මණ්ඩලයට අදාළ පනත් සශෝධනයේදී මණ්ඩලයෙහි නිර්දේශයන් ලබා දිය යුතුය. |
| (ආ) | 2010 මැයි 12 දිනැති අංක 1653/ 19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, යම් තැනැත්තෙකු විසින් ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්තාපනය සඳහා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යයි නම් ඔහු විසින් අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය (NDDCB) විසින් නිකුත් කරන බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වුවද, 2022 ජූලි මාසය වන විට බලපත්‍ර කල් ඉකුත්වී තිබුණු පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 11 ක් විය. 2019, 2020 හා 2021 වර්ෂවල බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද අදායම පිළිවෙලින් රු.17,000, රු.13,500 හා රු.4,000 ක් වූ අතර 2022 වර්ෂයේ කිසිදු අදායමක් ලැබී නොතිබුණු බැවින් බලපත්‍ර අලුත් කිරීම ක්‍රම ක්‍රමයෙන් අඩුවී ඇති බවද නිරීක්ෂණය විය. මෙසේ බලපත්‍ර ලබා නොගන්නා හෝ අලුත් නොකරන ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථාන නියාමනය කිරීම සඳහා 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනත අදාළ පරිදි සංශෝධනය කර නොතිබුණි. | බලපත්‍ර ලබා නොගත් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නියාමනය කිරීම හෝ වසා දැමීම සම්බන්ධයෙන් 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතෙහි විධිවිධාන ඇතුළත්ව නොමැති බව හා ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ඇති බව. | පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නියාමනය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා පනත අදාළ පරිදි සංශෝධනය කළ යුතුය. |
| (ඇ) | දීර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයන් පිළිබඳ පසු විපරම් ක්‍රියාවලිය දුර්වල මට්ටමක පැවතීම නිසා නැවත නැවත ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානයන්හි සේවය ලබාගැනීමේ ප්‍රවනතාවයක් පැවති බව නිරීක්ෂණය වූ අතර මණ්ඩලයට අයත් නිට්ටඹුව, මහනුවර, ගාල්ල සහ තලංගම යන ප්‍රතිකාර හා | ලෝක සෞඛ්‍ය සංවිධානය, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ කාර්යාලය වැනි සංවිධානයන්හි පැහැදිලි කිරීම් අනුව මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම රෝගී තත්වයක් වන බව, ප්‍රතිකාර කාලය අවසන් කරන අය නැවත නැවත මත්ද්‍රව්‍යවලට යොමුවීම මත අපගේ සේවාවන් නැවත ලබා දීමට සිදුවූ බව හා මණ්ඩලයේ බාහිර සේවා අංශයේ | පසුවිපරම් ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය කර පවත්වාගෙන යාම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පුනරුත්තාපන මධ්‍යස්ථානවල ප්‍රතිකාර කාලය අවසන් කළ සේවාලාභීන් 157 දෙනෙකු සහ 119 දෙනෙකු පිළිවෙලින් 2020 හා 2021 වර්ෂ තුළදී නැවත ප්‍රතිකාර සඳහා මධ්‍යස්ථාන වෙත පැමිණ තිබුණි. | නිලධාරීන් 30 දෙනෙකු මඟින් පසුරැකවරණ ක්‍රියාවලිය සිදු කරන බව, දිවයිනේ විවිධ ප්‍රදේශවලින් සේවාලාභීන් ප්‍රතිකාර සඳහා යොමු වුවද දිවයිනම ආවරණය වන පරිදි පසුරැකවරණ සේවා ලබාදීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බව, ප්‍රතිකාර මධ්‍යස්ථානවල මාසික පසුරැකවරණ හමු මඟින් පසුගිය වසරවල පසුරැකවරණ සේවා සිදු කළත් කොවිඩ් වසංගතය සහ පවතින ආර්ථික අර්බුදය නිසා එම වැඩසටහන්ද අඛණ්ඩව පවත්වාගෙන යාමට අපහසුවූ බව හා දුරකථන ඇමතුම් මඟින් සේවාලාභීන් ගෙන්වා අදාළ පසුරැකවරණ සේවාවන් ලබා දෙන බව. | |
| (ඇ) | මධ්‍යස්ථානවල පුහුණු කාර්ය මණ්ඩල හිඟකම සහ නිසි ආරක්ෂිත පියවරයන් අනුගමනය කර නොතිබුණු බැවින් සේවාලාභීන්ගේ පලායෑම් ඉහළ අගයක් ගෙන තිබුණි. 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළදී පමණක් සේවාලාභීන්ගේ නිදහස් කිරීම්වලින් සියයට 10 ක්ම පලායෑම් විය. | මේ වන විට සේවාලාභීන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රියාකළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව කාර්ය මණ්ඩලය වෙත උපදෙස් ලබාදීමට, කාර්ය මණ්ඩලය වැඩි කිරීමට හා ආරක්ෂාව සඳහා සිවිල් ආරක්ෂක නිලධාරීන්ගේ සේවා මුර වැඩි කිරීමට පියවරගෙන ඇති බව. | පලායාම් අවම කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මධ්‍යස්ථාන වෙත යොමුකරන සහ යොමු වන සේවාලාභීන් රඳවා ගැනීම සහ ඔවුන්ගේ ආරක්ෂාව පිණිස සහ පිටතින් ආයතන පරිශ්‍රයට ඇතුල්වීම වැළැක්වීම සඳහා නවදිගන්තය සහ මහනුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වටා ආරක්ෂිත වැටක් ඉදි කර නොතිබුණි. | මේ සඳහා අදාළ නිලධාරීන් ස්ථානීය පරීක්ෂාවන් සිදුකර ඇස්තමේන්තු ලබා ගෙන ඇති බව හා ඉදිරියේදී මුදල් ලැබෙන ආකාරය අනුව මෙම කාර්ය කඩිනමින් නිම කිරීමට කටයුතු කරන බව. | ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා විකල්ප මූල්‍ය ප්‍රතිපාදන ක්‍රම සඳහා යොමු විය යුතුය. |
| (ඊ) | සේවාලාභීන්ගේ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා මධ්‍යස්ථාන වෙත විමර්ශණ නිලධාරීන් පැමිණිය යුතු වුවද, එවැනි අධීක්ෂණ කටයුතු ක්‍රමවත්ව සිදුවී නොතිබුණි. නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි විමර්ශණ නිලධාරීන්ගේ පැමිණීම සටහන් කිරීම සඳහා පවත්වාගෙන යන ලේඛනයට අනුව, 2022 ජනවාරි 11 දින වන විට විමර්ශණ නිලධාරීන් අවසන් වරට මධ්‍යස්ථානය විමර්ශණය සඳහා පැමිණ තිබුණේ 2019 මාර්තු 20 දින බව නිරීක්ෂණය විය. | මේ වන විට විමර්ශණ කටයුතු යළි ක්‍රියාත්මක කර ඇති බව. | මධ්‍යස්ථාන නිසි කළට වේලාවට විමර්ශණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | නවදිගන්තය ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි සේවාලාභීන් අවශ්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා ආසන්නතම රෝහල වෙත යොමු කිරීමේදී නිසි ආරක්ෂක ක්‍රමවේදයක් නොතිබුණු අතර කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම මත සේවාලාභීන් පලායාමේ අවස්ථා පැවති බව නිරීක්ෂණය විය. බන්ධනාගාර හරහා උසාවි මඟින් යොමු කරන සේවාලාභීන් සම්බන්ධයෙන් මණ්ඩලයට දැඩි වගකීමක් පවතින නමුත් මේ සම්බන්ධයෙන් යම් විධිමත් ආරක්ෂක පියවර ගෙන නොතිබුණි. | මේ සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇති බව හා කාර්යය මණ්ඩලය කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබාදී ඇති බව. | ප්‍රමාණවත් සුදුසු කාර්ය මණ්ඩලයක් ලබාදී නිසි ආරක්ෂණ පියවරයන් හඳුන්වා දිය යුතුය. |
| (ඌ) | මධ්‍යස්ථාන වෙත යොමු කරන සේවාලාභීන් වෙත පුනරුත්ථාපන කාලසීමාවේ පළමු සතිය තුළ මධ්‍යස්ථාන තුළ සුදුසු පරිසරයක් නිර්මාණය කළ යුතු වුවද, පවතින පහසුකම් සහ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම මත එවැනි පරිසරයක් නිර්මාණය නොවීමෙන් සේවාලාභීන් පුනරුත්ථාපන ක්‍රියාවලියට අනුගතවීම නිසි පරිදි සිදු නොවන බව නිරීක්ෂණය විය. මහනුවර මධ්‍යස්ථානයෙහි රඳවා තබනුයේ අවුරුදු 21 ට අඩු මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ සේවාලාභීන් වන නමුත් මධ්‍යස්ථානය ස්ථාපිත ගොඩනැගිල්ල අබලන් තත්ත්වයේ පැවති අතර අනෙකුත් පහසුකම්ද නියමිත ප්‍රමිතියෙන් තොරව පැවතුණි. | සේවාලාභීන්ගේ නේවාසිකාගාරය සීමිත ඉඩකඩක් සහිත පැරණි ගොඩනැගිල්ලක් වන බව, එම ඉඩකඩ උපයෝජනය කරමින් සේවාලාභීන්ට නේවාසික පහසුකම් සැපයීමට සිදුව තිබෙන බව හා මධ්‍යස්ථානයෙහි පහසුකම් සංවර්ධනය කිරීමට කඩිනමින් පියවර ගන්නා බව. | ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ සේවාලාභීන් සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට උපරිමයෙන් කටයුතු කළ යුතුය. |
| (එ) | මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා පැය 24 පුරාම ක්‍රියාත්මක වන දුරකථන අංක 1927 උපකාරක සේවාව 2020 මාර්තු මාසයේ සිට හඳුන්වාදී තිබුණි. ආරම්භයේදී ප්‍රධාන කාර්යාලයෙහි සුදුසු ස්ථානයක භාෂා ත්‍රිත්වයෙන්ම පිළිතුරු දිය හැකි 13 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයකින් යුක්තව එය ක්‍රියාත්මක කර තිබුණි. නමුත් 2022 ජනවාරි 13 දින සිට තලංගම පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි දුරකථන උපකාරක සේවාවක් සඳහා සුදුසු නොවන ස්ථානයක මෙම සේවාව ස්ථාපිත කර තිබුණු අතර 4 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් යුක්තව ක්‍රියාත්මක වන බැවින් නිසි ඵලදායීත්වයක් ලබා ගත නොහැකිවී තිබුණු බව නිරීක්ෂණය විය. | අවශ්‍ය වන යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි ප්‍රධාන කායීයාලය තුළ ලබාදීමට පවතින ප්‍රායෝගිකව ගැටළු සඳහා විසඳුමක් ලෙස 1927 සේවාව පැය 24 පුරාම ක්‍රියාත්මක තලංගම මධ්‍යස්ථානය තුළ ස්ථාපනය කළ බව, දැනට එම ස්ථානයේ බාහිර ශබ්ද නොඇසෙන ලෙස වෙනම partition එකක් සවි කිරීම සඳහාද, 1927 සේවාව සඳහා ස්ථිර නිලධාරීන්ගේ පවතින ගැටළුව විසඳීම සඳහාද අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව හා දැනට පවතින කාර්ය මණ්ඩල හිඟය අවම කර ගැනීම සඳහා මෙලෙස බාහිර සේවා අංශයේ නිලධාරීන්ගේ දායකත්වය ලබාගැනීමට තීරණය කර ඇති බව. | දුරකථන අංක 1927 උපකාරක සේවාව නිසි පරිදි ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් සැපයිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | වර්තමානය වන විට කාන්තාවන් මත්ද්‍රව්‍යවලට යොමුවීමේ ප්‍රවණතාවයේ වැඩිවීමක් පැවතියද මණ්ඩලයෙහි කාන්තා පුනරුත්ථාපන කටයුතු සම්බන්ධයෙන් වූ අවධානය අඩුවී තිබුණි. 2019 වර්ෂයේ කාන්තා සේවාලාභීන් 29 කට, 2020 වර්ෂයේ 21 කට හා 2021 වර්ෂයේ එක් සේවා ලාභියකුට වශයෙන් ප්‍රතිකාර සහ පුනරුත්ථාපන කටයුතු සිදු කර තිබුණු අතර වර්තමානය වන විට කිසිදු සේවාලාභියකුට ප්‍රතිකාර සහ පුනරුත්ථාපන කටයුතු සිදු නොකරන බව නිරීක්ෂණය විය. කාන්තා පුනරුත්ථාපන සහ ප්‍රතිකාර කටයුතු නවතා දැමීම කාර්යය මණ්ඩලය හිඟකම නිසා සිදු වුවක් ලෙස දක්වා සිටියද, පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සේවාවලට අදාළ කාර්යයන් සඳහා බඳවාගත් කාන්තා නිලධාරීන් 15 දෙනෙකු ඇතුළත් 29 දෙනෙකු මණ්ඩලයෙහි වෙනත් කාර්යයන් සඳහා යොමු කර තිබුණි. | මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ කාන්තාවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීමට ගාල්ල මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් අත්‍යාවශ්‍ය භෞතික සම්පත් ගොඩනැංවීම උදෙසා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොතිබුණු බව, කාන්තා ප්‍රතිකාර කටයුතු සඳහා උපදේශනමය මැදිහත්වීම අඛණ්ඩව සිදු කරනු ලබන බව හා ඒ සඳහා අවශ්‍ය සහාය බන්ධනාගාර ඇතුළු අනෙකුත් ආයතන වෙත ලබා දෙන බව. | කාන්තාවන් සඳහා ප්‍රතිකාර කටයුතු නැවත ක්‍රියාත්මක කිරීමට උපරිමයෙන් කටයුතු කළ යුතුය. |

3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් පවත්වා තිබුණු උපදේශන සහතිකපත් පාඨමාලා ගාස්තු ලෙස ලැබී තිබුණු රු.1,740,000 කින් රු.435,000 ක් හා රු.87,000 ක් පිළිවෙලින් සුභසාධක සංගමය හා බෞද්ධ සංගමය වෙත ලබාදී තිබුණි. | 2019 පෙබරවාරි 26 දිනැති මණ්ඩලික රැස්වීමේදී ගන්නා ලද තීරණයන් අනුව කටයුතු කර ඇති බව. | මණ්ඩලය සතු සියළු අදායම් මණ්ඩලයේ ආදායම් ලෙස සළකා ගිණුම්ගත කළ යුතුය. |

3.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

---------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අප්‍රේල් 30 දින රු.4,027,518 ක් වැයකර තිස් අවුරුදු බදු පදනම මත හෝමාගම පිහිටි පර්චස් 40 ක ඉඩම මිලදී ගෙන තිබුණු නමුත්, 2022 අගෝස්තු 30 දින වන විටත් එය ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ප්‍රකාරව, මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට නැවත පවරාදී ඒ වෙනුවට වෙනත් සුදුසු ප්‍රදේශයකින් ඉඩමක් ලබාගැනීම හෝ දැනට භාවිතා කර ඇති වසර 6 සඳහා නිශ්චිත බදු මුදලක් ලබාදී ඉතිරි මුදල් ප්‍රතිපූරණය කර ගැනීමට ඇති හැකියාව සලකා බැලීමට හෝ කටයුතු කළ යුතු බව මණ්ඩලය තීරණය කර ඇති බව. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 අප්‍රේල් මාසයේදී රු.3,884,160 කට මිලදී ගන්නා ලද වීඩියෝ පැනලය තාක්ෂණික උපදේශක තහවුරුවක් නොමැතිව ස්ථාපනය කර තිබුණි. විවෘත කළ දින සිට හා වසර 3 ක වගකීම් කාලය තුළදී මෙම පැනලය 6 වරක් ක්‍රියාවිරහිතව තිබුණු අතර 2022 අගෝස්තු 22 දින වන විටත් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව වාර්තා කිරීම සඳහා නිලධාරීන් පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇති බව හා අදාළ වාර්තා ලැබුණු පසු මේ පිළිබඳව ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා බව. | මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගැනීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සේවාලාභීන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි අවශ්‍ය උපකරණ වලින් සමන්විත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පැවතියද එම දැනුම ලබාදීමට ප්‍රමාණවත් දැනුමැති වෘත්තීය නිලධාරියෙකුගේ සේවය ලබා නොගැනීම මත එම උපකරණ භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. | ආයතනයේ නඩත්තු කටයුතු හා අවශ්‍යතාවයන් මත අදාළ උපකරණ භාවිතයට ගන්නා බව හා අදාළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය නැවත සක්‍රීය තත්ත්වයට ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බව. | මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය කඩිනමින් ක්‍රියාකාරී මට්ටමට පත් කළ යුතුය. |

3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය සඳහා 36000 BTU වායුසමීකරණ යන්ත්‍රයක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේ තාක්ෂණික ඇගයීමේදී යන්ත්‍රයෙහි මිල සහ නඩත්තු පිරිවැයෙහි වර්තමාන අගය යන දෙක එකවර සලකා බැලීමකින් තොරව යන්ත්‍රය සඳහා අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත රු.241,380 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. තෝරා ගෙන තිබුණු ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු යන්ත්‍රයෙහි නඩත්තු පිරිවැය අනෙකුත් ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු නඩත්තු පිරිවැයට වඩා ඉතා ඉහළ අගයක් ගෙන තිබුණු බවද නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමග එකඟවන බව හා ඉදිරියේදී මෙවන් දෝෂ මඟහරවාගෙන කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන නිසි ලෙස අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ලැප්ටොප් පරිගණක 11 ක් සහ ඩෙස්ක්ටොප් පරිගණක 07 ක් මිලදී ගැනීම සඳහා රු.2,302,050 ක් වැයකර තිබුණි. අවශ්‍යතා තාක්ෂණික පිරිවිතරවලට අනුව ලැප්ටොප් පරිගණකවල තිරයෙහි විකර්ණය අඟල් 15.6 ක් විය යුතු වුවද, මිලදී ගෙන තිබුණු ලැප්ටොප් පරිගණකවල තිරයෙහි විකර්ණය අඟල් 14 ක් පමණක් වූයෙන් හා විකර්ණය 15.6 ක් වූ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් සඳහා ඉදිරිපත් කර තිබුණු මිලටම මිලදී ගෙන තිබීම හේතුවෙන් අවශ්‍යතාවය නිසි පරිදි ඉටුවී නොතිබුණු අතර මූල්‍යමය වශයෙන් පාඩුවක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය. | වෙළඳපොලේ මිල උච්චාවචනය නිසා මෙම මිලදී ගැනීම කඩිනමින් සිදුකළ යුතුව පැවති බැවින්ද, අදාළ පිරිවිතරවල සංකීර්ණ මට්ටමේ වෙනසක් නොමැති බැවින්ද මෙම මිලදී ගැනීම සිදු කළ බව හා කොවිඩ් 19 වසංගතය හේතුවෙන් නිවසේ සිට මාර්ගගත ක්‍රමයට වැඩ කරන හා මහජනතාව සමඟ සමීපව වැඩසටහන් කරන පාර්ශවයන්ට යන්ත්‍ර නොමැතිවීම මත ආයතනික කටයුතු සුමටව පවත්වාගෙන යාමට නොහැකිවූ බැවින් ඉල්ලුම්කර ඇති පිරිවිතරවලින් පරිබාහිරව මෙම පරිගණක මිලදී ගත් බව. | විධිමත් පරීක්ෂණයක් සිදුකර පාඩුවට වගකිව යුතු පාර්ශව හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සේවාලාභීන්ගේ නේවාසිකාගාරයෙහි උළුවහු හා ජනෙල් සඳහා ආරක්ෂිත යකඩ වැට සවිකිරීමට අදාළ ප්‍රසම්පාදනය සඳහා ආයතන 02 කින් 2021 ජුනි 18 දිනත් තවත් ආයතනයකින් 2021 ජුනි 23 දිනත් ලංසු කැඳවා තිබුණු බැවින්ද, 2021 ජුනි 23 දින ලංසු කැඳවීමට අනුව ඉදිරිපත් කර තිබුණු ලංසුව 2021 ජුනි 21 දින මණ්ඩලය වෙත ලැබී තිබුණු බැවින්ද හා ලංසු භාර ගන්නා අවසන් දිනට දින 07 කට පසු ලැබී තිබුණු ලංසුවක් ප්‍රතික්ෂේප නොකර භාර ගෙන රු.474,140 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව එම ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීම හේතුවෙන්ද ප්‍රසම්පාදනයේ විනිවිධභාවය ආරක්ෂාවී නොතිබුණු බවත්, ව්‍යාජ ලංසු කැඳවීමක් සිදුකර තිබුණු බවත්, ඒ හේතුවෙන් මූල්‍යමය අක්‍රමිකතාවයක් සිදුවීමේ ඉඩකඩක් පැවති බවත් නිරීක්ෂණය විය. | ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවීම සඳහා අදාළ නිලධාරීන්ව දැනුවත් කර ඇති බව. | විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජූලි 01 දිනට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 37 කට සමාන පුරප්පාඩු තනතුරු 138 ක් පැවති අතර අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 63 කට සමාන කාර්ය මණ්ඩලයකින් මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම තුළ, අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට පවතින අධ්‍යක්ෂ තනතුරුවල පුරප්පාඩු රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් මහින් රාජකාරි ආවරණය කිරීමේ පදනමින් සිදු කරන බව, මධ්‍යස්ථාන සහ ක්ෂේත්‍ර රාජකාරි සිදු කරන නිලධාරීන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්‍යාල සඳහා අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් සහ බහුකාර්‍ය සංවර්ධන කාර්‍ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ කාර්‍ය සහායකයින් මහින් ආවරණය කර ගන්නා බව, තනතුරු 56 ක් සඳහා පුවත්පත් දැන්වීම් පළකර ඇති බව, ඇතැම් තනතුරු සඳහා විභාග පවත්වා ඇති බව හා 2021 අගෝස්තු 31 දිනැති අංක 21/1596/304/134 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඇති බැවින් සේවකයින් බඳවා ගැනීමට නොහැකිවී ඇති බව. | නිසි අධ්‍යයනයකින් පසුව අනුමත කාර්යමණ්ඩලය සුදුසු පරිදි සංශෝධනය කළ යුතුය. |
| (ආ) | මණ්ඩලයෙහි ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 06 න් තනතුරු 03 ක්ද මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 14 න් තනතුරු 06 ක්ද සමාලෝචිත වර්ෂයේදී පුරප්පාඩුව පැවතුණි. ඉන් අධ්‍යක්ෂ (පරිපාලන) සහ අධ්‍යක්ෂ (මූල්‍ය) යන තනතුරු 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. | මෙම පුරප්පාඩු පිරවීම සඳහා අවස්ථා කීපයකදී පුවත්පත් දැන්වීම් පළකර අයදුම්පත් කැඳවුවද, අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්පත් නොලැබුණු බව, මෙම පුරප්පාඩු නැවත පිරවීම සඳහා 2021 නොවැම්බර් 02 දින අමාත්‍යාංශ අනුමැතිය සඳහා ලිපියක් යොමු කර ඇති බව හා මේ වන විට අමාත්‍යාංශ නිලධාරීන් දෙදෙනෙකු මෙම තනතුරු දෙකෙහි රාජකාරී ආවරණය කරන බව. | මෙවැනි අත්‍යවශ්‍ය තනතුරු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ මණ්ඩලයෙහි ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ අංශ හතෙහි භෞතික ප්‍රගතිය සියයට 100 සිට සියයට 40 දක්වා පරාසයක් තුළ වූ අතර ඒ හා සමගාමීව අංශ හතෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 0 සිට සියයට 57 දක්වා පරාසයක් තුළ විය. ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතිය අතර අසාමාන්‍ය විචලතාවයක් පැවති බව නිරීක්ෂණය විය. | මණ්ඩලයේ පැවති මූල්‍ය දුෂ්කරතා නිසා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා ගැනීමට නොහැකිවීම මත මූල්‍ය ප්‍රගතිය අඩුවී ඇති බව. | ඇස්තමේන්තුගත සැලැසුම් කාලානුරූපීව සමාලෝචනය කර අවශ්‍ය සංශෝධනයන් සිදු කර අනුමත කර ගත යුතුය. |